රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2025

මගේ අංකය : EST-1/CIRL/03/0001
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2025.04.02

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම

දිවයිනේ සීඝ්‍ර ජනගහන වර්ධනයට සාපේක්ෂව ඉහළ යන කසළ ජනනය හමුවේ කසළ කළමනාකරණය දැඩි අභියෝගයකට ලක් වී ඇති අතරම අපද්‍රව්‍ය ජනනය කරන්නන් වශයෙන් එම අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කිරීමේ වගකීම, සියලුම පුරවැසියන්ට, රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනවලට එක ලෙස පැවරී ඇත. එබැවින් කසළ කළමනාකරණය සම්බන්ධයෙන් මතුව ඇති අභියෝග ජය ගැනීම සඳහා කසළ කළමනාකරණය පිළිබඳව වූ ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව සියලුම රාජ්‍ය ආයතන තිරසර කසළ කළමනාකරණ ක්‍රමවේද සඳහා අනුගත වීම ඉතා වැදගත් වේ.

02. බොහොමයක් රාජ්‍ය ආයතන නාගරික ප්‍රදේශ කේන්ද්‍රගතව පිහිටා ඇති අතර එම ආයතන වෙත දෛනිකව පැමිණෙන විශාල ප්‍රමාණයක් වූ රාජ්‍ය සේවකයින් හරහා නිර්මාණය වන අපද්‍රව්‍ය පාලනය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීම ඉතා වැදගත් වේ. රාජ්‍ය ආයතන සියල්ල මෙම චක්‍රලේඛය මඟින් ආවරණය වන අතර, එම ආයතන දැඩි ලෙස අවධානය යොමු කරමින් පහත උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

### 2.1 සියලුම රාජ්‍ය ආයතන 3R සංකල්පයට අනුගත වීම. (අවම කිරීම, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීකරණය)

3R සංකල්පයට අනුගතවීම සඳහා අනුගමනය කළ යුතු උපාය මාර්ග.

2.1.1 රාජකාරි කටයුතුවල දී හැකිතාක් දුරට කඩදාසි භාවිතය අවම කිරීම.

දෛනික රාජකාරි කටයුතුවල දී ඉවත දමන කඩදාසි ප්‍රමාණය අවම කිරීම සඳහා හැකි සෑම විටම සන්නිවේදන කටයුතු සඳහා ඩිජිටල් මාධ්‍ය භාවිතා කිරීම මෙන්ම මුද්‍රණ කටයුතුවල දී කඩදාසියේ දෙපසම භාවිතා කිරීම සඳහා කාර්ය මණ්ඩලය දැනුම්වත් කිරීම.

2.1.2 තනි භාවිත ප්ලාස්ටික් භාවිතය අධෛර්යමත් කිරීම සහ පරිසර හිතකාමී විකල්ප භාවිතය මඟින් ප්ලාස්ටික් පරිභෝජනය අවම කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කරන ලද අංක 2341/30 සහ 2023 ජූලි මස 19 දිනැති ගැසට් නිවේදනය මඟින් තනි භාවිත ප්ලාස්ටික් (Single use plastic) අයිතම 09ක් මෙරට තුළ භාවිතය තහනම් කිරීමට කටයුතු යොදා ඇති බැවින් සියලුම ආයතන ප්‍රධානීන් ස්වකීය ආයතන පරිශ්‍රයන් තුළ කුමන ආකාරයක හෝ තනි භාවිත ප්ලාස්ටික් වර්ග භාවිතය වළක්වා ගැනීම සහ විකල්ප භාවිත කෙරෙහි කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම කළ යුතු ය. මෙහි දී,

- ආහාර රැගෙන ඒම සඳහා දිරාපත් වන ආහාර දවටන හෝ නැවත භාවිතා කළ හැකි ආහාර බඳුන් භාවිතයට උනන්දු කිරීම.
- රැස්වීම්/ සාකච්ඡා/ වැඩමුළු පැවැත්වීමේ දී ප්ලාස්ටික් වතුර බෝතල් භාවිතය අවම කිරීම සඳහා ක්‍රමවේද යෙදීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- රාජ්‍ය ආයතනවල පිහිටි ආපණශාලාවල ද ප්ලාස්ටික් බෝතල් සහ ආහාර දවටන භාවිතය අවම කිරීම සඳහා කටයුතු කිරීම.
- ආයතන තුළ විවිධ කාර්යයන් සඳහා බැනර් හා පුවරු නිර්මාණයේ දී සහ ආයතනය විසින් පවත්වනු ලබන විවිධ උත්සවවල දී පරිසර හිතකාමී ද්‍රව්‍ය හා ක්‍රමවේදවලට අනුගත වීම.

2.1.3 පරිසර හිතකාමී සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි නිෂ්පාදන සඳහා ප්‍රමුඛතාව ලැබෙන ප්‍රසම්පාදන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

ප්‍රසම්පාදන කාර්යවලදී පරිසර හිතකාමී සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි නිෂ්පාදන මිලදී ගැනීම සඳහා පවත්නා විධිවිධාන තුළ ප්‍රමුඛතාව ලබා දීමටත්, ඒ සඳහා ප්‍රසම්පාදන දැන්වීම්වලට අදාළ නිර්ණායක ඇතුළත් කිරීමටත්, ලංසු ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු දැනුම්වත් කිරීමත් සිදු කළ යුතු ය.

2.1.4 තිරසර පරිභෝජන පුරුදු අනුගමනය කිරීම.

සමස්ථ කාර්යමණ්ඩලය වෙත තිරසර පරිභෝජන පුරුදු අනුගමනය කිරීමට අවශ්‍ය දැනුම්වත්භාවය ලබා දීම, තිරසර පුරුදු අනුගමනය කිරීම, දිරිමත් කිරීම සහ සියලුම ආයතන පරිශ්‍රයන් අපද්‍රව්‍යවලින් තොර කලාප බවට පත් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

## 2.2 අපද්‍රව්‍ය ප්‍රභවයේ රැස් කිරීම සහ බැහැර කිරීම

2.2.1 අපද්‍රව්‍ය නිසි පරිදි එක් රැස් කිරීම.

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව අපද්‍රව්‍ය ජනනයේ දී නිසි පරිදි වෙන් කර බැහැරලීම කෙරෙහි අවධානය යොමු කරමින් ආයතන පරිශ්‍රයේ ජනනය වන අපද්‍රව්‍ය, නම් කරන ලද බඳුන්වලට බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම. එනම්;

- දිරාපත් වන අපද්‍රව්‍ය (උදා:- ඉවතලන ආහාර, උද්‍යාන කසළ)
- ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය (උදා:- කඩදාසි, PET වැනි ප්ලාස්ටික්, ලෝහ, වීදුරු)
- ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය (උදා:- පෝසිලේන්, ෆයිබර්)
- අන්තරායකර අපද්‍රව්‍ය (උදා:- ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, සායනික අපද්‍රව්‍ය)

2.2.2 අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම.

ක්‍රමානුකූලව අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා පළාත් පාලන ආයතන හෝ බලපත්‍රලාභී අපද්‍රව්‍ය එකතු කිරීමේ සමාගම් සමඟ සම්බන්ධීකරණය වෙමින් නිසි ක්‍රමවේද අනුව පරිසර හිතකාමීව බැහැර කිරීම සඳහා පියවර ගැනීම.

2.2.3 විභවය සහිත ස්ථාන තුළ කාබනික අපද්‍රව්‍ය කොම්පෝස්ට් කිරීම දිරිමත් කිරීම.

දෛනිකව ජනනය වන අපද්‍රව්‍ය වැඩි ප්‍රතිශතයක් කාබනික අපද්‍රව්‍ය වීම මත එමගින් සිදුවන පාරිසරික දූෂණය සහ මීතේන් වැනි හරිත වායු ජනනය කෙරෙහි වන ඍජු බලපෑම අවම කර ගැනීම සඳහා විභවය සහිත ආයතන පරිශ්‍රවල කොම්පෝස්ට් බඳුන් ආශ්‍රයෙන් කොම්පෝස්ට්කරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි නැඹුරු වීම.

2.2.4 බලපත්‍රලාභී ප්‍රතිචක්‍රීකරණ සමාගම් සමඟ සහයෝගයෙන් ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම.

ජනනය වන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි තත්ත්වයේ අපද්‍රව්‍ය නිසි පරිදි වෙන් කර, පළාත් පාලන ආයතන මාර්ගයෙන් බලපත්‍රලාභී ප්‍රතිචක්‍රීකරණ සමාගම් වෙත ලබා දීමෙන් ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම. එහි දී සියලුම ආයතනවලට ස්වකීය ආයතන පරිශ්‍රවල ජනනය වන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි තත්ත්වයේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ සමාගම් වෙත අලෙවි කිරීමට ද හැකියාව ඇත.

2.2.5 නියාමන මාර්ගෝපදේශ අනුගමනය කරමින් අන්තරායකර සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීම.

රාජ්‍ය ආයතනවල ජනනය වන අන්තරායකර අපද්‍රව්‍ය, විශේෂයෙන් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය නිසි පරිදි නිසි මාර්ගෝපදේශ අනුගමනය කරමින් බැහැර කිරීම සහතික විය යුතු ය.

## 2.3 දැනුම්වත් කිරීම, ධාරිතා සංවර්ධනය සහ පසු විපරම

2.3.1 කාර්යමණ්ඩලය දැනුම්වත් කිරීම.

තිරසර අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා අවස්ථානුකූලව පුහුණුවීම් සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් 3R සංකල්පය ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

2.3.2 අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම.

සියලුම ආයතන විසින් අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් පරිදි සිදු කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගවල තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එම කටයුතු අධීක්ෂණයට සුදුසු නිලධාරියෙක් නම් කර වගකීම භාර දීමත් සුදුසු කාල පරාස තුළ එම ප්‍රගතිය සමාලෝචනය කිරීමත් සිදු කළ යුතු ය.

2.3.3 සේවාලාභීන් දැනුම්වත් කිරීම.

සියලුම ආයතන ප්‍රධානීන් විසින් ස්වකීය ආයතන පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සුදුසු ස්ථානවල දැන්වීම් ප්‍රදර්ශනය කර, ආයතනය වෙත පැමිණෙන සියලු සේවාලාභීන් දැනුම්වත් කිරීම මඟින් සේවාලාභීන් ද ඊට අනුකූලව කටයුතු කිරීම තහවුරු කළ යුතු ය.

03. මෙම චක්‍රලේඛය බලාත්මක දින සිට මාස 06ක කාලසීමාවක් ඇතුළත ස්වකීය ආයතනය සඳහා විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් සංවර්ධනය කර ක්‍රියාත්මක කළ යුතු ය. ඒ සඳහා ආයතනයේ සියලුම නිලධාරීන් සහ සේවකයින් අදාළ පළාත් පාලන ආයතනය සහ බලපත්‍රලාභී ප්‍රතිචක්‍රීකරණ සමාගම සමඟ සම්බන්ධීකරණය වෙමින් කාල පරාස සහිත විධිමත් සැලැස්මක් සකස් කර ගත යුතු අතර එම සැලැස්මේ තිරසර පැවැත්ම තහවුරු කෙරෙන අධීක්ෂණ වැඩපිළිවෙළක්ද සමඟ එය ක්‍රියාත්මක කළ යුතු ය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ade-i@pubad.gov.lk